06 වන පිටෙන්

රජයේ ආශිර්වාදය  යටතේ කල නින්දිත ව්‍යාපාරයක්. අපේ රටේ එකතුවන කසළ සඳහාවත් කිසිම ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් හරියාකාරව කරගන්නට බැරි මේ රජයට අනුන්ගේ කසල ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද? මේ සඳහා අප රජයක් යටතේ දැඩි පියවර ගන්නවා

ප්‍රශ්නය- මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම ගැන ඔබතුමාගේ අදහස

පිළිතුර- අප රටේ ජීවත්වන සියලූම මනුෂ්‍යයන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු විය යුතු බව මා තරයේ කියා සිටිනවා. ලෝකයේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කළ පසු එම දඬුවම දී ඇත්තේ නිවැරදි පුද්ගලයකුට බව ඔප්පු වී ඇති අවස්ථාද තිබෙනවා.නමුත් ඔහුට ජීවිතය යළි ලබාදීමට නොහැකියි. බොහෝ විට අධික රණ තීන්දු  පදනම් වන්නේ පොලිසිය දෙන සාක්ෂි මතයි. පොලිසිය පක්ෂග්‍රාහීව ක්‍රියා කළහොත් නිවැරදිකරුවෙකු වැරදිකරු වන අවස්ථා ඇතිවන්නට පුළුවන්. අභියාචනාධිකරණයේදී වැරැදිකරුවන් නිවැරැදිකරුවන් වූ අවස්ථාද එමටයි. මරණීය දණ්ඩනය නියම කිරීමට බලාපොරොත්තු වන්නේ මත් ජාවාරමට සම්බන්ධවී බන්ධනාගාරගතව සිටිමින් බන්ධනාගාරයේ සිට යළිත් මත් ව්‍යාපාර මෙහෙයවන්නන්ට. ඉතින් මා කියන්නේ මුලින්ම කළ යුත්තේ බන්ධනාගාරගතව ඉන්නා මත් ව්‍යාපාර මෙහෙයවන්නට අනුබල දී ඇති බන්ධනාගාර නිලධාරීන්ට විරුද්ධව තද බල ක්‍රියාමාර්ග ගත යුතු බවයි.

ප්‍රශ්නය- ශ්‍රී  ලංකාව සිංහල බෞද්ධ රටක් ද?

පිළිතුර- ලංකාවේ සිංහලය හෙවත් සිව් හෙළය බිහිවීම අදින් වසර විසි හයදහසකට පෙර මහා සම්මත මනු රජුගෙන් ආරම්භ වුණ බවට දැන් ඉතිහාසඥයින් මත පළකරනවා. ලංකාවේ සිටි හෙළයින් වර්ග හතර එනම් යක්ෂ නාග දේව හා රාක්ෂ යන අතර කොටස් එකමුතු කොට එක්සත් රටක් සිව් හෙළයක් හැදුවේ එම රජු. ඔවුන් බෞද්ධයන්ට පත් වූයේ මිහිඳු හිමියන් ලංකාවට බුදු දහම රැගෙන ඒමත් සමග. නමුත් ඊට පෙර ද ලංකාවේ බෞද්ධයින් සිටියා. ඒ බුදුන්වහන්සේ තුන්වතාවක් ලංකාවට වැඩම කළ නිසා. ඕනෑම රටක් කුමන ආගමක කුමන ජාතියක යැයි පිළිගනු ලබන්නේ ඒ රටේ සිටිනා බහුතරය මතයි. එසේ බැලූ විට ලංකාවේ බහුතරය සිංහල බෞද්ධ නිසා ලංකාව සිංහල බෞද්ධ රටක් බව අවිවාදයෙන් පිළිගත යුතුව තිබෙනවා. කිතුනු ආගමික නායක මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්  මේ රට සිංහල බෞද්ධ රටක් බවත් ඒ සංස්කෘතිය යටතේ ඔවුන්ගේ ආගමික කටයුතු සිදුකළ යුතු බවත් වෙනත් රටවල මෙන් නොව කිතුනුවන්ට සිංහල බෞද්ධයාගෙන් ලැබෙන විශිෂ්ට සහයෝගය අගය කළ යුතු බවත්  කියා සිටිනවා. ලංකාවට මෑතකදී පැමිණි සාමය හා සහජීවනය පිළිබඳ ලෝක මුස්ලිම් නායකයෙකු වන ආචාර්ය මොහොමඩ් බින් අබ්දුල් කරීම් තුමා ප්‍රකාශ කර සිටියේ ලංකාව සිංහල බෞද්ධ රටක් බවත් එම සංස්කෘතිය යටතේ මුස්ලිම් ප්‍රජාව හැඩගැසිය යුතු බවත් සිංහල බෞද්ධයින් මුස්ලිම් ප්‍රජාවට දී ඇති ඉඩ ප්‍රස්ථාව ඉතා ප්‍රශස්ත බවත්. තත්ත්වය එහෙමනම් ලංකාව සිංහල බෞද්ධ රටක් කියන එකෙන් සංහිඳියාවට කිසිම බාධාවක් ඇති වන්නේ නෑ. .මගේ පෞද්ගලික මතය ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ රටක් යන වගයි.

පිළිතුරු සැපයීමේදී මෙතුමා දැක්වූ ප්‍රඥාවන්ත ස්වභාවය මා විශ්මයට පත් කළේය. "එහෙනම් චිත්‍රාන් මට දැන් විශේෂ ගමනකට පිටත් වන්නට තියෙනවා. චිත්‍රාන් කාලා නෙමෙයි ආවෙ මං හිතන්නේ. මේ සුමිත් එක්ක ගිහිල්ලා කෑම කන්න".

මුළු ලෝකයේම ගෞරවයට පාත්‍ර වූ විශිෂ්ඨ ජන නායකයෙකු වූ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සෞන්දර්යාත්මක ගැමි ගතිය ශ්‍රී ලාංකිකයින් ආකර්ෂණය වීමට ඇති එක් හේතුවක් බව මට මෙහිදී පසක් විය.

**ඔබතුමාට ජයවේවා!**



